සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved



# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - නීතිවේදී උපාධි ප්‍රවේශ විභාගය
# Sri Lanka Open University – LLB - Law Entrance Course

**වර්ෂය - 2002**
**Year - 2002**

**පැය 2 යි**
Two hours

Index No: ......................................................................

Checked as Correct.

..............................................................
Invigilator's Initials

Name : .........................................................................................................................

**විභාග අපේක්ෂකයාට උපදෙස් :**

* මෙම පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විත වේ

(අ)I වන ප්‍රශ්න පත්‍රය - සාමාන්‍ය බුද්ධිය
(අ)II වන ප්‍රශ්න පත්‍රය - සාමාන්‍ය දැනීම
(අ)III වන ප්‍රශ්න පත්‍රය - භාෂා පරීක්ෂණය

**ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයිය යුතු ආකාරය :**

* **Iවන ප්‍රශ්න පත්‍රය- සාමාන්‍ය බුද්ධිය**ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියළුම ප්‍රශ්නවලට පිළිතුරු ලකුණු කල යුත්තේ පිළිතුරු පත්‍රයේ පමණි. දී ඇති පිළිතුරු වලින් වඩාත්ම නිවරැදි පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ එම පිළිතුරට අදාල අකුර මත කතිර ලකුණක් යොදන්න. (උදාහරණයක් ලෙස (a) පිළිතුර නිවරැදි නම්)

උදා : ~~(a)~~ (b) (c) (d)

ගණක යන්ත්‍ර හෝ වෙනත් එබඳු උපකරණ භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම්ය

* **II වන ප්‍රශ්න පත්‍රය - සාමාන්‍ය දැනීම** ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

* **III වන ප්‍රශ්න පත්‍රය - භාෂා පරීක්ෂණය**කොටස් 02 කින් සමන්විත වේ.**A**කොටස ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය වන අතර **B** කොටස සිංහල භාෂා පරීක්ෂණය වේ. **A**සහ**B**යන කොටස් දෙකටම දී ඇති ස්ථාන වල පිළිතුරු සපයන්න

* විභාග ශාලාධිපති විසින් දැණුම් දෙන තුරු ප්‍රශ්න පත්‍රය විවෘත නොකරන්න

විභාග අංකය නියමිත ස්ථානයේ සඳහන් කරන්න

**For examiner's Use Only**

| Page No : | Question No: | Marks |
|---|---|---|
| සාමාන්‍ය බුද්ධිය | | |
| 2 | 01 - 06 | |
| 3 | 07 - 16 | |
| 4 | 17 - 25 | |
| 5 | 26 - 31 | |
| 6 | 32 - 40 | |
| සාමාන්‍ය දැනීම | | |
| 7 | 1 - 10 | |
| 8 | 11 - 21 | |
| 9 | 22 - 32 | |
| 10 | 33 - 40 | |
| භාෂා පරීක්ෂණය | | |
| | **Total** | |

...................
Checked by



ජයග්‍රාහී ගමන් මග නීර්තා Neertha Legal Education Center

# I වන ප්‍රශ්න පත්‍රය - සාමාන්‍ය බුද්ධිය

* ප්‍රශ්න 40 ටම පිළිතුරු සපයන්න
* ඔබට සපයා ඇති පිළිතුරු පත්‍රයේ ඔබේ පිළිතුරු සළකුණු කරන්න. මෙම ප්‍රශ්න පත්‍රයේ ලියා ඇති පිළිතුරු පරීක්ෂා කරනු නොලැබේ

**ප්‍රශ්න අංක 1 - 4 දක්වා**

කාර්යාලයක පහත සඳහන් පරිගණක යන්ත්‍ර කට්ටල අතර එකිනෙක සමග ඊමේල් පණිවිඩ හුවමාරු කරගැනීමේ හැකියාවක් පවතී.

- A සහ B, A සහ C, C සහ E, E සහ G, E සහ H, G සහ D, D සහ F.
- D සහ B අතර ඇත්තේ එක් අතකට පමණක් පණිවිඩ හුවමාරු කර ගත හැකි සම්බන්ධතාවක් පමණි. එනම් D ගෙන් B ට පමණි.
- පරිගණක තුල දී හැර මේ කිසිම මාර්ගයකට අතරමැද දී සම්බන්ධ විය නොහැකිය.
- කාර්යාලය තුල වෙනත් සම්බන්ධතා මාර්ග හෝ පරිගණක නොමැත.
- පරිගණක සමග සම්බන්ධතා පිහිටුවා ඇති දිශාවන්ට පමණක් ඊමේල් පණිවුඩ යැවිය හැකිය.

1. F පරිගණකයෙන් B පරිගණයකට ඊමේල් පණිවුඩ යැවීම සඳහා එම ඊමේල් පණිවුඩය පහත සඳහන් පරිගණකය හරහා ගමන් කළ යුතුය.
(a) A (b) B (c) C (d) D

2. C සහ E අතර මාර්ගගත සම්බන්ධතාව බිඳ වැටී ඇත. A ගෙන් H ට පණිවුඩයක් යැවිය යුතු ව ඇත. A සහ H හැර තවත් පරිගණක කීයක් හරහා එම පණිවුඩය යා යුතු වේද ?
(a) 5 (b) 4 (c) 3 (d) 2

3. C සහ E අතර මාර්ගගත සම්බන්ධතාව බිඳ වැටී ඇත. එසේ නම්,
(a) B ගෙන් F ට (b) D ගෙන් G ට (c) D ගෙන් F ට (d) E ගෙන් A ට ඊමේල් පණිවුඩයක් යා නොහැකිය.

4. E ගෙන් G ට ඊමේල් පණිවුඩයක් යැවිය හැකි වුවත් G ගෙන් E ට ඊමේල් පණිවුඩයක් යැවීමේ හැකියාවක් නොපවතින බව උපකල්පනය කරන්න. එවිටD ගෙන් ඊමේල් පණිවුඩයක් යා හැක්කෙ ?
(a)B, F සහ/ හෝ G ට වුවද, A, C, E හෝ H ට නොවේ. (b) A, B, C සහ/ හෝ G ට වුවද, F, E හෝ H ට නොවේ.
(c)A, C, E, F සහ/ හෝ G ට වුවද, B හෝ H ට නොවේ. (d) A, B, C, E, F, G ට සහ/ හෝ H ට.

**ප්‍රශ්න අංක 5 - 7 දක්වා**

ගෘහණියක් විශේෂ පළතුරු සලාදයක් පිළියෙල කරමින් සිටී. ඇයට තෝරා ගැනීම සඳහා පළතුරු වර්ග 6 ක් ඇත. ඒවා නම් ඇපල්, මිදි, දොඩම්, චෙරි, ස්ට්‍රෝබරි සහ කෙසෙල් ගෙඩි වේ. පහත සඳහන් තොරතුරු ද මෙහිදී අදාළ වේ.

- පළතුරු සලාදයට දොඩම් ඇතුළත් වන්නේ නම් මිදි සහ කෙසෙල් ගෙඩි ඇතුළත් විය නොහැකිය.
- පළතුරු සලාදයෙහි ඇපල් හෝ කෙසෙල් ගෙඩි තිබේ.
- පළතුරු සලාදයෙහි ස්ට්‍රෝබරි අඩංගු නොවුනහොත් එහි කෙසෙල් ගෙඩිද නොතිබිය යුතුය.
- පළතුරු සලාදයෙහි මිදි සහ චෙරි යන දෙකින් එකක් මිස දෙකම අඩංගු නොවියි යුතුය.

5. පළතුරු සලාදයෙහි කෙසෙල් ගෙඩි තිබේ නම් පහත සඳහන් ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ කුමක් ද ?
(a)පළතුරු සලාදයෙහි මිදි අඩංගු වේ. (b) පළතුරු සලාදයෙහි දොඩම් අඩංගු වේ.
(c)පළතුරු සලාදයෙහි චෙරි අඩංගු වේ. (d)පළතුරු සලාදයෙහි ස්ට්‍රෝබරි අඩංගු වේ.

6. පළතුරු සලාදයෙහි ඇපල් අඩංගු නොවන්නේ නම් සහ චෙරි අඩංගු වන්නේ නම් පහත සඳහන් ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ කුමක් ද?
(a)පළතුරු සලාදයෙහි දොඩම් අඩංගු වේ. (b) පළතුරු සලාදයෙහි දොඩම් අඩංගු නොවේ.
(c)පළතුරු සලාදයෙහි ස්ට්‍රෝබරි අඩංගු නොවේ. (d)පළතුරු සලාදයෙහි කෙසෙල් අඩංගු නොවේ.

7. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය බව දන්නේ නම් එම ප්‍රකාශ අතුරින් කුමන ප්‍රකාශය වෙනත් පළතුරක් පළතුරු සලාදයෙහි තිබිය යුතු වීම හෝ නොතිබිය යුතු වීම තීරණය කිරීමට හේතු නොවන්නේ ද ?

(a)පළතුරු සලාදයෙහි මිදි අඩංගු විය යුතුය. (b) පළතුරු සලාදයෙහි දොඩම් අඩංගු විය යුතුය.
(c)පළතුරු සලාදයෙහි චෙරි අඩංගු විය යුතුය. (d)පළතුරු සලාදයෙහි මිදි අඩංගු නොවිය යුතුය.

**ප්‍රශ්න අංක 8 - 11 දක්වා**

ශිෂ්‍යාවක් විශ්ව විද්‍යාලයක පාඨමාලා 6 ක් හදාරන්නීය. ඒවා නම් භූගෝල විද්‍යාව, ඉතිහාසය, පුවත්පත් කලාව, තර්ක ශාස්ත්‍රය, වාග් විද්‍යාව සහ ගණිතය වේ. එක් එක් පාඨමාලාව සඳහා ඇය ලබා ඇති ශ්‍රේණි එකෙනෙකට වෙනස් ය. ලැබිය යුතු ශ්‍රේණිවල ඉහළ සිට පහළට අනුපිළිවෙල A,B,C,D,E සහ F වේ. පහත සඳහන් තොරතුරු ඉදිරිපත් වී ඇත.

- භූගෝල විද්‍යාව සඳහා ඇය ලබා ඇති ශ්‍රේණිය වාග් විද්‍යාවට වඩා ඉහළය.
- පුවත් පත් කලාව සඳහා ඇය B ශ්‍රේණියක් ලබා ඇත.
- තර්ක ශාස්ත්‍රය සඳහා ඇය ලබා ඇති ශ්‍රේණිය ඉතිහාස විෂයට ලබා ඇති ශ්‍රේණියට වඩා එක ශ්‍රේණියකින් ඉහළ හෝ පහළ වේ.

8. ඉතිහාසය විෂය සඳහා ඇය D ශ්‍රේණියක් ලබන්නේ නම් වාග් විද්‍යාව සඳහා ඇයට ලැබිය හැකි ඉහළම ශ්‍රේණිය විය හැක්කේ පහත සඳහන් ශ්‍රේණි අතුරින් කවර ශ්‍රේණියද ?

(a)A (b) B (c) C (d)F

9. ගණිතය සඳහා ඇය E ශ්‍රේණිය ලබන්නේ නම් භූගෝල විද්‍යාව සඳහා ඇය ලබා ගත යුත්තේ පහත සඳහන් ශ්‍රේණි අතුරින් කවර ශ්‍රේණිය ද ?

(a)A (b) B (c)C (d) F

10. තර්ක ශාස්ත්‍රය සඳහා ඇය D ශ්‍රේණිය ලබන්නේ නම් භූගෝල විද්‍යාව සඳහා ඇයට ලැබිය හැකි පහළම ශ්‍රේණිය විය හැක්කේ පහත සඳහන් ශ්‍රේණි අතුරින් කවර ශ්‍රේණිය ද?

(a)A (b) B (c)C (d)E

11. පහත සඳහන් පාඨමාලා අතුරින් කවර පාඨමාලාවක් සඳහා ඇයට A ශ්‍රේණියක් ලබාගත හැකි වන්නේ ද ?

(a)පුවත්පත්කලාව (b) තර්ක ශාස්ත්‍රය (c)වාග් විද්‍යාව (d)ගණිතය

**ප්‍රශ්න අංක 12 - 14 දක්වා**

මහාචාර්යවරයෙක් සම්මන්ත්‍රණයක් සඳහා අවශ්‍ය සියලු සිසුන් පහත නම් සඳහන් සිසුන් ඇතුළත් ශිෂ්‍ය කණ්ඩායමෙන් තෝරා ගනී. ජානක, කමලා, ලාල්, මැණික්, නාමල්, ඔෂාන් සහ පාලිත එම සිසුන්ගේ නම් වේ. පහත සඳහන් කොන්දේසිවලට යටත් ඔනෑම ශිෂ්‍ය සංයුතියක් තෝරා ගත හැකිය.

- ජානකට ආරාධනා කරන්නේ නම් කමලාටද ආරාධනා කළ යුතුය.
- කමලා සහ මැණික් යන දෙදෙනාටම ආරාධනා කරන්නේ නම් නාමල්ට ආරාධනා කළ නොහැකිය.
- මැණික් සහ ලාල් යන දෙදෙනාටම ආරාධනා කරන්නේ නම් නාමල්ට ආරාධනා කළ නොහැකිය.
- ලාල්ට ආරාධනා කරන්නේ නම් ඔෂාන් හෝ පාලිත යන දෙදෙනාගෙන් කෙනෙකුට ආරාධනා කළ යුතුය.
- නාමල් හෝ ඔෂාන් යන දෙදෙනාගෙන් එක් අයෙකුට පමණක් ආරාධනා කළ යුතුය. එහෙත් දෙදෙනාටම ආරාධනා නොකළ යුතුය.
- ඔෂාන් හෝ පාලිත යන දෙදෙනාගෙන් එක් අයෙකුට ආරාධනා කළ හැකි වුව ද දෙදෙනාටම ආරාධනා කළ නොහැකිය.

12. ආරාධනා කිරීමට සුදුසු කණ්ඩායම වන්නේ මින් කවර කණ්ඩායම ද ?

(a)ජානක, කමලා සහ පාලිත (b) මැණික්, ඔෂාන් සහ පාලිත
(c)කමලා, නාමල් සහ ඔෂාන් (d)මැණික්, ලාල් සහ ඔෂාන්

13. ලාල් සහ පාලිත යන දෙදෙනාට ම ආරාධනා කරන්නේ නම් පහත සඳහන් ප්‍රකාශවලින් සත්‍ය වන්නේ කවර ප්‍රකාශය ද ?

(a)මැණික්ට ආරාධනා කළ යුතුය. (b) ඔෂාන්ට ආරාධනා කළ යුතුය.
(c)නාමල්ට ආරාධනා කළ යුතුය. (d)ජානකට ආරාධනා කළ නොහැකිය.

14. ජානක සහ නාමල් යන දෙදෙනාටම ආරාධනා කරන්නේ නම් පහත සඳහන් ප්‍රකාශවලින් අසත්‍ය වන්නේ මින් කවර ප්‍රකාශය ද?

(a)පාලිතට ආරාධනා කරනු ලැබේ. (b) මැණික්ට ආරාධනා කළ යුතුය.
(c)ජානකට ආරාධනා කළ යුතුය. (d)ඔෂාන්ට ආරාධනා නොකරනු ලැබේ.

**ප්‍රශ්න අංක 15 - 18 දක්වා**

ළදරු පාසලක කාමර දෙකක තීන්ත ආලේප කරනු ලැබේ. තෝරාගත හැකි වර්ණ 6 ක් ඇත. ඒවා වන්නේ දම්, නිල්, කොළ, කහ, තැඹිලි සහ රතු යන වර්ණය. එක් එක් කාමරයෙහි විවිධ තීන්ත වර්ණ තුනක් ආලේප කළ යුතුය.

- දම් සහ කහ යන වර්ණ එකම කාමරයේ ආලේප කළ යුතුය.
- නිල් සහ තැඹිලි එකම කාමරයේ ආලේප කළ නොහැකිය.
- කාමර දෙකෙහි එකම වර්ණ සංයුතිය භාවිතා නොකළ යුතුය.

15. එක් කාමරයක් සඳහාපහත සඳහන් වර්ණ සංයුති අතරෙන් එක් වර්ණ සංයුතියක් හැර අන් සියළු වර්ණ සංයුතීන් යොදා ගත හැකිය. යොදාගත නොහැකි වර්ණ සංයුතිය කුමක් ද ?
(a) දම්, නිල්, රතු (b) දම්, කොළ, කහ (c)දම්, කහ, රතු (d)නිල්, කොළ, රතු

16. දම්පාට ආලේප කිරීමට තෝරා ගෙන ඇති කාමරයක් සඳහා තෝරා ගත හැක්කේ පහත සඳහන් කුමන වර්ණද ?
(a) නිල් - කොළ (b) නිල් - තැඹිලි (c)නිල් - රතු (d)කොළ - කහ

17. පහත සඳහන් වර්ණ සංයුතීන් අතුරෙන් යොදාගත හැකි වර්ණ සංයුතිය කුමක් ද?

| කාමර අංක 1 | කාමර අංක 2 |
|---|---|
| **(a) දම්, නිල්, කහ** | දම්, කහ, තැඹිලි |
| **(b) දම්, කොළ, රතු** | කොළ,කහ, තැඹිලි |
| **(c) දම්, කහ, තැඹිලි** | දම්, නිල්, තැඹිලි |
| **(d) නිල්, කොළ, රතු** | නිල්, තැඹිලි, රතු |

18. එක් කාමරයක් නිල්, කොළ සහ රතු වර්ණවලින් ආලේප කරනු ලැබුවහොත් අනෙක් කාමරය ආලේප කිරීම සඳහා පහත සඳහන් වර්ණ සංයුතීන් අතුරෙන් එක් වර්ණ සංයුතියක් හැර අනෙක් වර්ණ සංයුතීන් යොදා ගත හැකිය. යොදා ගත නොහැකි වර්ණ සංයුතිය කුමක් ද?
(a) දම්, නිල්, කහ (b) දම්, කොළ, කහ (c)දම්, කහ, රතු (d)නිල්, කොළ, රතු

**<u>ප්‍රශ්න අංක 19 - 30 දක්වා</u>**

පහත දැක්වෙන්නේ එක්නෙක සම්බන්ධතාවකින් යුත් වචන යුගලයක් හා අමතරව දෙන ලද වචන යුගල හතරකි. එයින් මුලින් ම ඇති වචන යුගලයේ සම්බන්ධතාවය වඩාත් හොඳින් විස්තර කෙරෙන වචන යුගලය තෝරන්න.

19. සුවිපුල් ඃ විපුල්
(a) අනියත ඃ නියත (b) අවගුණ ඃ ගුණ (c)අවියත් ඃ වියත් (d)සසොබන ඃ සොබන

20. සදාචාර ඃ ආචාර
(a) අපගමන ඃ ගමන (b) ආරෝග්‍යශාලා ඃ ශාලා (c)පරෝපකාර ඃ උපකාර (d)අවිනීත ඃ විනීත

21. ජලය ඃ අයිස්
(a) වානේ ඃ යකඩ (b) කිරි ඃ මෝරු (c)බත් ඃ සහල් (d)රෝස ඃ සුවඳ

22. ආත්ම ඃ සංයම
(a) පුද්ගල ඃ චර්යා (b) ඉන්ද්‍රිය ඃ ගෝචර (c)වර්ණ ඃ සංකලන (d)ඉන්ද්‍රිය ඃ සංවර

23. සිසි ඃ සොමි
(a) කය ඃ වෙර (b) අත ඃ මෝරු (c)බත් ඃ සහල් (d)රෝස ඃ සුවඳ

24. භාමත ඃ සාගතය
(a) නැව ඃ වරාය (b) ශක්තිය ඃ බලය (c)වෛද්‍යවරයා ඃ බෙහෙත් (d)රෝගය ඃ මරණය

25. නිල්මිණි ඃ මැණික්
(a) ඇඟිලි ඃ සිරුර (b) පුස ඃ නැකත (c)පය ඃ ඇඟිලි (d)වර්ණ ඃ පාට

26. අග ඃ මුල
(a) ආයාස ඃ ප්‍රයාස (b) ශූන්‍ය ඃ පූර්ණ (c)නිත්‍ය ඃ ස්ථිර (d)නිශ්චය ඃ සත්‍ය

27. සමර ඃ සරම
(a) පලස ඃ සලප (b) බලක ඃ ලකබ (c)මලක ඃ කලම (d)කලබ ඃ කබල
28. වර්ෂාව ඃ පොද
(a) සම්භාර ඃ අල්ප (b) දොළඃ ඇල (c)ගඟ ඃ ඇළ (d)සාගරය ඃ ගංගාව

29. රසමද ඃ දමසර
(a) වනකත ඃ තකනව (b) වරලස ඃ ලසවර (c)මදමන ඃ නමදම (d)නවමල ඃ නමදම

30. සුවෙන් ඃ වසන
(a) ඉවෙන් ඃ ඉවර (b) මුවෙන් ඃ වමන (c)දුරින් ඃ දිරන (d)රුවින් ඃ රවන


ජයග්‍රාහී ගමන් මග Neertha Legal Education Center

**ප්‍රශ්න අංක 31 - 40 දක්වා**

31. 3, 15, 35, ?, 99, 143
(a)63 (b) 77 (c)69 (d) 81

32. 1, 1, 8, ?, 27, 9, 64
(a)4 (b) 9 (c) 6 (d) 16

33.

| | | |
|---|---|---|
| 13 | 6 | 4 |
| 6 | 8 | 6 |
| 1 | 6 | ? |

(a)7 (b) 13 (c) 10 (d) 8

34. 90, 4, 28, 7, 21, 3, 18, ?
(a)8 (b) 6 (c) 21 (d) 15

35. 49, 81, ?, 169, 225
(a)113 (b) 116 (c)119 (d) 121

36. 5, 9, 15, ?, 33, 45, 59
(a)24 (b) 22 (c)20 (d) 23

37. 3, 8. ?, 24, 35, 48
(a)16 (b) 12 (c)13 (d) 15

38. 69, 68, 64, ?, 39, 14
(a)56 (b) 54 (c) 52 (d) 55

39. 5000, 250, 250, ?, 2
(a)10 (b) 5 (c)4 (d) 2.5

40. 3, 7, 15, ?, 63
(a)27 (b) 29 (c)31 (d) 33



ජයග්‍රාහී ගමන් මග Neertha Legal Education Center